# ලෝකාලෝකය

## 2019 දෙසැම්බර් - 2020 පෙබරවාරි කලාපය

අපට
ළදරුවෙක් උපන්නේය,
අපට පුත්‍රයෙක් දෙන ලද්දේය;
ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට
තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය
අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත්
දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය,
සමාදානයේ කුමාරයා, යයි
කියනු ලබන්නේය.
යෙසායා 9 : 6

*2020 නව වසර ඔබ සැමට දෙවියන්වහන්සේගේ සමාදානය, ප්‍රීතිය, ප්‍රේමය, බලාපොරොත්තුව, ඇදහිල්ල, නිදහස හා බලය වඩ වඩා අත්දකින්නාවූ වසරක් වේවා !*


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# වෙනසක්

ආදරණීය දුවේ පුතේ, අපි දැන් 2019 වර්ෂයේ අවසානයට ඇවිත්. කාලය බොහෝ වේගයෙන් ගමන් කරනවා. පුංචි ඔයාලත් අධ්‍යාපන වැඩ කටයුතු නිසා කාර්යබහුලයි නේද? දැන් ඔයාලා කැමතිම පාසල් නිවාඩුව ලැබෙන්නයි යන්නේ. ඔව් නත්තල් නිවාඩුව. දුවේ, පුතේ ඔයාලා හැමෝටම නත්තල කිව්වාම මොනවද මතක් වෙන්නේ. තෑගිබෝග, සැරසිලි, රස කෑම ජාති, අලුත් ඇඳුම් පැළඳුම් මේ හැමදෙයක් එක්ම තිබෙන සතුට "නත්තල" යන වචනය පවා අපේ සිත්වලට ගෙන එන්නේ සතුටක්. නමුත් මේ සතුට අර්ථවත් වෙන්නේ යේසුස්වහන්සේ හිටියොත් විතරයි. උන්වහන්සේ නැති සතුට හරිම හිස්. මේ සතුට ඔබේ හදවතට, ජීවිතයට ලැබෙන්නේ සැබෑවටම ඔබේ හදවතට යේසුස්වහන්සේ පිළිගත්තොත් විතරයි. මම අද ඔයාලට කියාදෙන කතාව හොඳින් කියවා තේරුම්ගන්න ඕනේ.

දුවේ, පුතේ ශුද්ධබයිබලයේ **ලූක් සුභාරංචි පොතේ 19 වන පර්ච්ඡේදයේ 1 පදයේ සිට 10 පදය දක්වා** සඳහන් වන යේසුස්වහන්සේට සාකෙවුස් හමුවීම හරි පුදුමයි. යේසුස්වහන්සේ යෙරිකෝව නම් නගරයෙන් ගමන් කරන විට බදු අයකරන්නන්ගේ ප්‍රධාන නිලධාරියෙක් වූ සාකෙවුස්ට යේසුස්වහන්සේව දකින්න අවශ්‍යය වුණා. නමුත් සාකෙවුස් මිටි පුද්ගලයෙක් නිසාත්, යේසුස්වහන්සේ වටා රැස්ව සිටි විශාල සෙනග නිසාත්



ඔහුට යේසුස්වහන්සේව දැකගන්න බැරි වුණා. ඔහු මාර්ගයේ ඉදිරියට දුවගෙන ගොස් අත්තික්කා ගහකට නැග්ගා. යේසුස්වහන්සේ එතනට ඇවිත් "සාකෙවුස් ගහෙන් බහින්න මම අද ඔබේ ගෙදර නවතිනවා"යි කී සේක. එතකොට සාකෙවුස් ඉක්මනට ගහෙන් බැහැලා ඔහුගේ ගෙදරට යේසුස්වහන්සේව පිළිගත්තා. ඒ විතරක් නෙමෙයි සාකෙවුස් තමන්ගේ පව්කාර ජීවිතය ගැන පසුතැවිලි වෙලා, වැරදි හදාගත්තා. ඔහු බොහෝ ප්‍රීති වුණා.

බලන්න දුවේ පුතේ, සාකෙවුස් ඉහළ නිළධාරියෙක් වුණත් ඔහුට අවශ්‍යය හැමදෙයම තිබුනත් ඔහුට සැබෑ ප්‍රීතිය හමුවුනේ ඔහු යේසුස්වහන්සේ පිළිගත් පසුවයි. ඒ වගේම පුංචි ඔයාලත් යේසුස්වහන්සේව ඔබේ ජීවිතයට පිළිගෙන සැබෑ සතුට ලබාගන්න. නත්තලේ සැබෑ ප්‍රීතිය අත්විඳින්න.

යේසුපිහිටයි!

**මීට, ආදර,**
**ශෂිලා නැන්දා**

# ශ්‍රේෂ්ඨ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

## හෙබ්‍රෙව් පොතෙහි එළිදරව්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජකත්වයේ ශ්‍රේෂ්ඨත්වය.

අප හෙබ්‍රෙව් පොත කියවන විට, එහි කතුවරයා යේසුස්වහන්සේගේ උත්තරීතර භාවය පිළිබඳ බොහෝ කරුණු ඉදිරිපත් කරන අතර එහි යේසුස්වහන්සේ උත්තම පූජකත්වය පිළිබඳව මනාව හා ඉතාමත් සරල ආකාරයට අපට පෙන්වා දෙයි.

### 01. දයාවන්ත හා විශ්වාසවන්ත උත්තම පූජකයා - (හෙබ්‍රෙව් 2:17)

දයාවන්ත එසේ නැතිනම් ප්‍රේමයෙන් පූර්ණවීම යේසුස්වහන්සේ සතු මහත් ගුණාංගයකි. පව්කාරයාගේ මිත්‍රයා **(ලූක් 7:34) යන විරුධාවලියලත් උන්වහන්සේ. සෙනගගේ පව් උදෙසා ශාන්තිකර පූජාවක් ඔප්පු කිරීමට....."** එනම් පව්කාරයාට හා දෙවියන්වහන්සේ අතර සිටීමට යේසුස්වහන්සේ පව්කාර මනුෂ්‍යයාට දයාවන්ත විය. එමෙන්ම දෙවියන්වහන්සේගේ වැඩය කිරීමට උන්වහන්සේට දෙවියන් වහන්සේව විශ්වාසවන්ත විය.

### යේසුස්වහන්සේ හා පව්කාරයන් අතර සම්බන්ධතාවය.

- ★ පව්කාරයන්ව ආශ්‍රය කළ සේක - **මතෙව් 9:10.**
- ★ පව්කාරයන් සමඟ කෑම කෑ සේක - **මතෙව් 9:11.**
- ★ පව්කාරයන්ව කැඳවූ සේක - **මතෙව් 9:13.**
- ★ පව්කාරයන් සමඟ මිත්‍රකම් පැවැත්වූ සේක - **මතෙව් 11:19.**
- ★ පව්කාරයන්ගේ පව්කමා කළ සේක - **මාර්ක් 2:5.**
- ★ පව්කාරයන්ට දේශනා කළ සේක - **ලූක් 15:11.**
- ★ පව්කාරයන්ව පිළිගත් සේක - **ලූක් 15:2.**
- ★ පව්කාරයන් සමඟ නවාතැන් ගත් සේක - **ලූක් 19:7.**
- ★ පව්කාරයන්ට ප්‍රේම කළ සේක - **රෝම 5:8.**
- ★ පව්කාරයන් උදෙසා ජීවිතය දුන් සේක - **රෝම 5:8.**
- ★ පව්කාරයන් ගැලවූ සේක - **1 තිමෝති 1:15.**
- ★ පව්කාරයන් උදෙසා වධවින්ද සේක - **1 පේත්‍රුස් 3:18.**
- ★ පව්කාරයන් උදෙසා විශ්වාසවන්තව සිටින සේක - **1 යොහාන් 1:9.**

පව්කරුවා සහ යේසුස්වහන්සේ අතර සම්බන්ධතාවය සොයා වඩවඩා දැනගන්න.

### යේසුස්වහන්සේගේ විශ්වාසවන්ත භාවය

- ★ පත්කළ තැනැත්තාට විශ්වාසව සිටිසේක - **හෙබ්‍රෙව් 3:2.**
- ★ ගෘහයේ සේවකයකු මෙන් විශ්වාසව සිටි සේක - **හෙබ්‍රෙව් 3:5.**
- ★ පුත්‍රයකු මෙන් විශ්වාසව සිටි සේක - **හෙබ්‍රෙව් 3:6.**

★ දුන් පොරොන්දු පිළිබඳ විශ්වාසව සිටින සේක - **හෙබ්‍රෙව් 10:23.**
★ පව්කමා කිරීමට විශ්වාසව සිටින සේක **- 1 යොහාන් 1:9.**
★ කැඳවීමට විශ්වාසව සිටින සේක **- 1 තෙසලෝනික 5:24.**
★ අපේ අවිශ්වාසවන්තකමේදීත් උන්වහන්සේ විශ්වාසව සිටින සේක **- 2 තිමෝති 2:13.**

## 02. අහස පසුකර ගියාවූ උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 4:14)

මෙහිදි අපට ගෙන දෙන අදහස් වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවමානභාවයයි. මෙලොව සිටි සියලුම ආගමික කතෘවරුන් හා දාර්ශනිකයන් හෝ පූජකයන් මරණයට පත් වී පොළවට පස් විය. සමහර අයගේ ඇටකටු හා සොහොන් කොත් අද දක්වා සංරක්ෂණය කොට පවත්වාගෙන යයි. එහෙත් අදටත් යේසුස්වහන්සේගේ ශාරීරික කොටස් හෝ සොහොනක් සොයාගත නොහැක. මක්නිසාද උන්වහන්සේ මළවුන්ගෙන් ශාරීරිකව නැගිට මිනිසුන් බලා සිටියදී ස්වර්ගයට ඔසවා ගනු ලැබූසේක. යේසුස්වහන්සේ අදහන්නන්ගේ මූලික අත්තිවාරම වන්නේද උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමයි. අද ද උන්වහන්සේ ජීවමානයි. උන්වහන්සේට සියල්ල පෙනෙන සේක. ඇසෙන සේක. අහස පසුකර ගොස් උන්වහන්සේ ස්වර්ගයේ සිංහාසනයේ හිඳගත් සේක. නිරන්තරයෙන් උන්වහන්සේගේ දරුවන් උදෙසා මැදහත්කම් කරන අතරම මේ විශ්වයේ අධිපතියාව සිටින සේක. රූප පිළිම, ගස්-ගල්, ඉර-සඳ, මනුෂ්‍යා වන්දනාමාන කරන සමාජයටම මෙයින් ප්‍රබල පණිවිඩයක් තිබෙන අතර මිථ්‍යාවට ලැදි අන්ධකාරයේ අතපත ගාමින් තම විමුක්තිය සොයා යන අය කෙසේ යථාර්තය අවබෝධ කර ගනු ඇතිද?

**"උන්වහන්සේ නිරතුරුම ජීවත්වන හෙයින් ඔවුන් කෙලවර දක්වා ගළවන්නට උන්වහන්සේට පුලුවන" (හෙබ්‍රෙව් 7:25).**

## 03. මනුෂ්‍ය (අපේ) දුක දැනෙන උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 14:15)

**"අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව"**

දෙවියන්වහන්සේම මාංශවත් වී අප අතරේ යේසුස්වහන්සේ නමින් වාසය කළ අතර උන්වහන්සේ සියයට සියයක්ම මනුෂ්‍යයකි. එබැවින් මනුෂ්‍ය හැඟීම් තේරුම් ගැනීමට, එනම් දුක, වේදනාව, තනිකම, සුළු කිරීම්, ප්‍රතික්ෂේප කිරීම, නින්දාවට පත් කිරීම, වැනි මනුෂ්‍යයකුට මුහුණ දීමට සිදුවන ඕනෑම හැඟීමක් තේරුම්ගැනීමේ හා එයට සංවේදීවීමට උන්වහන්සේට පුළුවන.

## 04. අප වාගේම පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 4:15)

**"සියලු ආකාරයෙන් අප වාගේම පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයාණෝ"**

මෙහිදි උන්වහන්සේගේ පුදුම ගුණාංගයක් ගැන මෙහි සඳහන් වේ. එනම් උන්වහන්සේ මනුෂ්‍යයකු හැටියට සෝදිසි කිරීම් තුළින් ගියත්, සියලු පරීක්ෂාවන්ට මුහුණ දුන්නත් උන්වහන්සේ කිසි පාපයක් කලේ නැත. දරාගැනීම, ඉවසිලිවන්තකම හා ඒ තුලින් ශුද්ධවූ ජීවිතයක් ගත කිරීම උන්වහන්සේගේ ජීවිතයේ කැපී පෙනෙයි. ජීවිතයේ විවිධ අමාරුකම් හා පරීක්ෂාවන් තුළින් ගමන් කරන විට පව් නොකර සිටීම වැදගත් කිතුණු ප්‍රතිපත්තියකි. එසේ ගමන් කරන ඕනෑම දේව දරුවකුම තේරුම් ගැනීමෙන් ඔහුට දේව කරුණාව හා අනුග්‍රහය දීමට යේසුස්වහන්සේට පුළුවන.

## 05. සදාකාල උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 6:20)

ඇදහිලිවන්තයන්ගේ සදාකාල ආරක්ෂාව පිළිබඳ බයිබලයේ ඇති තරම් සාක්ෂි ඇත. යේසුස්වහන්සේ සන්තක ජනතාව කිසිමදාක උන්වහන්සේගෙන් උදුරාගැනීමට නොහැකි බව බයිබලය නැවත නැවත සාක්ෂි දරයි. **රෝම 8** පරිච්ඡේදය කියවා බලන්න. **"මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරමි... මා නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි" (යොහාන් 14:3)**. මේ පොළවට සීමා වූ උත්තම පූජකයන් නොව සදාකාලයට යේසුස්වහන්සේ අපගේ උත්තම පූජකයා වී සිටියි.

## 06. ශුද්ධවූ, නිවැරදිවූ, පව්කරයන් ගෙන් වෙන්වූ, ස්වර්ගවලට වඩා උසස්වූ උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 7:26)

පාප පූජාව උදෙසා සම්පූර්ණ වූ පූජාවක් වීමට යේසුස්වහන්සේට හැකි වූයේ පාප රහිතව හා පරිපූර්ණව සිටි නිසාය, කිසිම කැළලක් හෝ පලුද්දක් යේසුස්වහන්සේ තුළ තිබුණේ නැත. එමනිසා මනුෂ්‍ය සංහතියේ පාපයේ කුලිය ගෙවා දැමීමට දෙවියන්වහන්සේගේ බැටළු පැටවා බවට උන්වහන්සේ පත් විය.

## 07. සැබෑ මණ්ඩපයේ සේවක වූ උත්තම පූජකයාණෝ - (හෙබ්‍රෙව් 8:2)

**රෝම 8:34 "දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ සිට මැදහත්කාරකම් කරන්නේ ක්‍රිස්තුස්වහන්සේය"**. පොළවේ තිබෙන දේව මාලිගාව ස්වර්ගයේ තිබෙන මණ්ඩපයේ අනුරුවකි. සැබෑ මණ්ඩපය නොහොත් දේව මාලිගාව, සේවය හා පූජාසනය තිබෙන්නේ ස්වර්ගයේ. ස්වර්ගයේ තිබෙන නියම ශුද්ධස්ථානයේ සේවකයාව සිටින්නේ යේසුස්වහන්සේය. ඇදහිලිවන්තයන්ගේ යාච්ඤාව නැමති පූජාව නිරන්තරයෙන් උන්වහන්සේ දෙවියන්වහන්සේට ඔප්පු කරන සේක. **හෙබ්‍රෙව් 9:11 හා හෙබ්‍රෙව් 10:21 හි** මෙය සඳහන් වේ. එනම් මනුෂ්‍යය සංහතියේ පාප පූජාවේ ලේ වන තමන්ගේ ම ලේ රැගෙන නියම, සැබෑ වූ ස්වර්ගයේ පිහිටා තිබෙන ශුද්ධස්ථානයට ඇතුල් වී එම පූජාව ඔප්පු කළ බවය.

මේ ආකාරයෙන් හෙබ්‍රෙව්වරුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තම පූජකත්වයේ තිබෙන උත්කෘෂ්ඨභාවය පෙන්වා දෙයි. අද උන්වහන්සේ මුළු සභාවට මෙම ගැඹුරු සත්‍යතාවය එළිදරව් වී ඇති බැවින් උන්වහන්සේගේ දරුවන් වන අපහටත් මනුෂ්‍යයන්ගේ උපකාරයෙන් තම පාප කමා කරගැනීමත්, තමන්ගේ දුක් කරදර වලට පිහිට යැදීමටත් නොගොස් ඒ සැබෑ වූ එකම ශ්‍රේෂ්ඨ උත්තම පූජකවූ යේසුස්වහන්සේ වෙතම යමු.

තව නොබෝ දිනයකින් උදාවන නව වසර ඔබ සැමට යහපත් වසරක් වේවායි පතමි. එමෙන්ම 2020 නව වසර තුළ වඩ වඩා යේසුස්වහන්සේට ප්‍රේම කරමින්, උන්වහන්සේට සේවය කිරීමට ඔබ සැමට දෙවියන්වහන්සේම ආශිර්වාද කර අවස්ථාවන්, ශක්තිය, ධෛර්ය දෙනසේක්වා!

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# ඇදහිල්ල

ඇදහිල්ල යන වචනය කිතුණුවන්ට ඉතා සමීපය. මක්නිසාද ඇදහිල්ල නැතුව දෙවියන්වහන්සේ ප්‍රසන්න කරන්නට ඇදහිලිවන්තයාට නොහැකිය. ඇදහිල්ල ගැන බොහෝ විස්තර කිරීම් බයිබලය පුරාවටම සඳහන් වේ. ඒවා අතරින් ඇදහිල්ලේ ලක්‍ෂණ 5ක් ඉතා කෙටියෙන් සලකා බලමු.

## 01. සරල ඇදහිල්ල (මතෙව් 7:7 - 11)

ඉහත දේව වචන කොටසේ සඳහන් පරිදි ඉල්ලූ විට දෙවියන්වහන්සේ අපට දෙන බව සරලව විශ්වාස කළ යුතුය. උන්වහන්සේ එය ඉටු කරන බව ඇදහිල්ලෙන් බලාපොරොත්තු විය යුතුය. අවශ්‍යතාවය වැඩිවන විට උන්වහන්සේ පසෙක ලා මනුෂ්‍යයන් කෙරෙහි ඇදහීම වෙනුවට උන්වහන්සේගෙන් හොඳම දේ ලැබෙන බව විශ්වාස කොට ස්ථිර ඇදහිල්ලෙන් සිටිමු.

## 02. නිර්භීත ඇදහිල්ල (දානියෙල් 6 පරි.)

දාරියුස් රජ විසින් අණ කරන පරිදි කිසිවකු දෙවිකෙනෙකු ඇදහීම තහනම් කර තිබුණු අවස්ථාවක **"දානියෙල් තමාගේ ගෙදරට ගොස්, තමාගේ උඩුමහලේ කවුළු යෙරුසලම දෙසට හැරී තිබියදී තමා ඊට පළමු කළාත් මෙන් දවසට තුන්වරක් දණින් හිඳ තමාගේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි යාච්ඤාකොට ස්තූති කළේය" (දානියෙල් 6:10).** ඔහු තමාට ලැබෙන දඬුවම දැන සිටියේය. නමුත් තමන්ගේ දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කරන්නට ඔහු නිර්භීත විය. දානියෙල් සිංහයන්ගේ මුවින් ගලවාගත් උන්වහන්සේ අප වෙනුවෙන් ද ක්‍රියා කරන සේක. අපිත් නිර්භීතව දෙවියන්වහන්සේව අදහමු.

## 03. අවංක ඇදහිල්ල (ලූක් 22 : 41 - 44)

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෙත්සෙමන උයනේදී යාච්ඤා කරමින්, **" පියාණනි ඔබ කැමතිසේක් නම් මේ කුසලානය මාගෙන් පහකළ මැනව. එසේ වී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවයි කීසේක"** උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බැවින් කුරුසියේ මරණයෙන් ගැලවී යාමට හැකියාව හා බලය උන්වහන්සේට තිබුණි. නමුත් දෙවියන්වහන්සේගේ කැමැත්ත පමණක්ම තමාගේ ජීවිතය තුළ සිදුවීමට උන්වහන්සේ අවංකව ඉඩහලසේක.

## 04. නිශ්චිත ඇදහිල්ල (ලූක් 18 : 35-43)

ඉහත දේව වචන කොටසෙහි සඳහන් පරිදි අන්ධ සිඟන්නන්ගේ නිශ්චිත ඇදහීම ගැන අවබෝධයක් ලැබේ. යේසුස්වහන්සේ තමා පසුකරගෙන යනු ඇසූ ඔහු **"යේසුස්වහන්ස, දාවිත්ගේ පුත්‍රය මට කරුණා කළ මැනවයි මොරගැසුවේය".** ඔහු අසල වූ අය ඔහුට තරවටු කළත් ඔහු උන්වහන්සේට ශබ්ද නඟා මොරගැසුවේය. තමා අවට කුමක් සිදුවුවත් ඔහුට නිශ්චිතවට තමාට උදව්කළ හැකි කෙනාට මොරගැසුවේය. එලෙසම යේසුස්වහන්සේ, **"මා විසින් නුඹට කුමක් කරන්නට කැමති දැයි"** ඔහුගෙන් ඇසූ විට **"ස්වාමීනි මට පෙනීම ලැබේවයි"** ඔහු නිශ්චිත පිළිතුරක් දුනි.

## 05. දැඩි ඇදහිල්ල (මාර්ක් 5 : 21 - 34)

මහලේ රෝගයට ගොදුරුව සිටි ස්ත්‍රියක් සුවය ලැබූ ආකාරය ගැන ඉහත දේව වචන කොටසෙහි සඳහන්ව තිබේ. වෙදුන් බොහෝ දෙනෙකුට තමන් සතු සියල්ල වියදම් කළත් ඇයට ඉන් සුවයක් ලැබුණේ නැත. යේසුස්වහන්සේ තුළින් තමාට සුවය ලැබෙනු ඇතැයි ඇය දැඩි ලෙස විශ්වාස කළේ **"උන්වහන්සේගේ වස්ත්‍ර වලටවත් අතගැසුවොත් මට සුවය ලැබේ යැයි ඇය කීවාය"** එලෙසම ඇයට සිදුවිය. ඇය දැනටමත් ඉතා අධෛර්යමත්ව සිටියත් යේසුස්වහන්සේ ගැන ඇය දැඩි විශ්වාසයකින් ඇදහුවාය. අපද අධෛර්යමත්ව හොඳටම වැටී සිටින අවස්ථාවලදී උන්වහන්සේ කෙරෙහි වඩා වැඩි ඇදහිල්ලක් ඇති කර ගනිමු.

**- ඇන්ඩෲ -**

# ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලි-වන්තයාගේ සැබෑ අනන්‍යතාවය.

1) **රෝම 5:1 / 3:24** - අප ධර්මිෂ්ඨකොට ගණන් ගෙන ඇත.

2) **රෝම 8:1 / 8:33** - අප කිසිදා වරදට හෝ දඬුවමට පත් කිරීමක් නැත.

3) **රෝම 8:2 / 7:6** - අප දැන් ව්‍යවස්ථාවෙන් හා පාපයෙන් නිදහස්ය.

4) **1 කොරින්ති 1:2** - අප දැන් ක්‍රිස්තුස්වහන්සේ තුල විශුද්ධිකර ඇත - (මුළුමනින්ම පවිකිරීම).

5) **1 කොරින්ති 3:17** - අප දැන් දෙවියන්වහන්සේගේ ශුද්ධ මාළිගාව බවට පත් වී ඇත.

6) **1 කොරින්ති 15:22** - අප දැන් මැරුණු පසු නැවත නැගිටීමට වලංගුය.

7) **2 කොරින්ති 5:17** - අප දැන් අලුත් ස්ත්‍රීන් හා පිරිමින්ය.

8) **2 කොරින්ති 5:21** - අප දැන් දෙවියන්වහන්සේ සමඟ සමගි වූ අයයි.

9) **ගලාති 3:28** - අප දැන් සියලු ඇදහිලිවන්තයන් සමඟ එක්කෙනෙක්ව සිටියි.

10) **එපීස 1:4** - අපට දැන් සියලු ආත්මික ආශිර්වාදවලින් ආශිර්වාද කර ඇත.

11) **එපීස 1:3** - අප දැන් ශුද්ධය, දෙවියන්වහන්සේ ඉදිරිපිට කැළලක් හෝ පළුද්දක් නැත.

12) **එපීස 1:5-6** - අප දැන් දෙවියන්වහන්සේගේ පවුලට අයත් අයය.

13) **එපීස 1:7** - අප දැන් සමාව ලැබූ අයය. පාපය අපගෙන් ඉවත් කර ඇත.

14) **එපීස 1:10-11** - අප දැන් ක්‍රිස්තුස් වහන් සේගේ උරුමයක් වී ඇත.

15) **එපීස 1:14** - අප දැන් දෙවියන්වහන්සේට අයිතිවූවන් ලෙස ශුද්ධාත්මයාණන්ගෙන් මුද්‍රා කොට ඇත.

16) **එපීස 2:6** - අප දැන් ස්වර්ගික ස්ථානවල හිඳුවන පිණිස නැගිටුවා ඇත.

17) **එපීස 2:10** - අප දැන් දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමු.

18) **එපීස 2:13** - අප දැන් දෙවියන්වහන්සේට ළංකර ගෙන ඇත.

19) **එපීස 3:5-6** - අප සමඟ දෙවියන්වහන් සේගේ පොරොන්දු බෙදාගෙන ඇත.

20) **එපීස 3:12** - අපට දැන් නිදහස්කම හා නිර්භිතකම ඇතිව දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟා විය හැක.

21) **එපීස 5:29-30** - අප දැන් ක්‍රිස්තුස්වහන් සේගේ ශරීරයේ අවයවයෝ බවට පත් වී ඇත. එමෙන්ම සභාවේ, එනම් එකිනෙකාගේ අවයවයෝ බවට පත් වී ඇත.

22) **කොලොස්සි 2:9-10** - අපට දැන් ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණකම දී ඇත.


23) **කොලොස්සි 2:11-15** - අප දැන් පරණ ස්වභාවයෙන් නිදහස් කර ඇත.

24) **තිමෝති 2:10** - අපට දැන් සදාකාල ජීවනය හා මහිමය ඇත.

**- ගුරු හරු -**

# කුහුඹුවාගෙන් අසන්න

ඉතා කුඩා සතෙක් තුලින් හිතෝපදේශ කතුවරයා අපට උගන්වන පාඩම මහත් විශාල බව අවිවාදයෙන් පිළිගත යුතුයි. බයිබලයේ කුහුඹුවා ගැන මා කියවා ඇත්තේ ඉතා ස්වල්ප වශයෙන්ය. **හිතෝපදේශ පොතේ 6 වන පරිච්ඡේදයේ 25 පදයේත්** කුහුඹුවා ගැන සඳහන් වී තිබෙනවා. මේ කුඩා සතා ගැන නොදන්නා කෙනෙක් නැහැ. ඌ ගෙන් උගත හැකි පාඩම් බොහෝ වෙතත් ඌ ගැන කිසිවෙක් සැලකිල්ලක් දක්වන්නේ නැහැ කීම වඩාත් සත්‍යයයි. ඌ ගැන දක්වන සැලකිල්ලක් වේ නම් ඒ කුහුඹුවා දෂ්ඨ කිරීමේදී වහාම ඌ වෙතින් හෝ කුහුඹු ගුල වෙතින් හැකි තරම් ඉක්මණින් ඉවත්වීම පමණයි. එහෙත් ශුද්ධ ලියවිල්ල මේ පුංචි සතා පිළිබඳව අපට මෙසේ උගන්වයි. **"අලසය කුහුඹුවා ළඟට ගොස්, උගේ මාර්ග බලා ඥානවන්ත වෙන්න" (හිතෝපදේශ 6:6).** ඔබේ කම්මැලි ජීවිතය, අලස ආත්මය යළිත් ප්‍රබෝධමත් ක්‍රියාශීලි තත්වයකට පත්කර ගන්න ඔබ කැමතිද? එසේ නම් කුහුඹුවා ආදර්ශයට ගන්නැයි මම ඔබට කියමි.



## ගබඩාකාරයා

කුහුඹුවාට ප්‍රධානියෙක් නැති බවද ඌට මුලාදෑනියෙක්වත් ආණ්ඩුකාරයෙක්වත් නැති බවද **හිතෝපදේශ 6:7** දක්වයි. ඔබ ගැන කෙසේද? ස්වාමියා නැති තැන සේවය අතපසු කරන අලසව අත්පොරවා ගන්න ඔබට කුහුඹුවා ටොක්කක් අනී. **"දෙවියන්වහන්සේගේ වැඩ අලසකමින් කරන්නාට සාපවේවා" (යෙරමියා 48:10).** ඔබ ගැලවීම ලබා ඇත්නම්, ස්වාමින්වහන්සේ තුළ වර්ධනය වීම සඳහා ඔබට සහභාගිකම, යාච්ඤාවේ පැවැතීම, දේව වචනය කියවීම හා ඉගෙනීම, ස්වාමින්වහන්සේ සිහිකිරීමේ රාත්‍රී භෝජන මෙහෙය, සාක්ෂි දැරීම, ස්වාමින්වහන්සේට ආත්ම දිනීමට වෙහෙසීම, යහපත් වැඩ වලට කාලය, ශ්‍රමය, මුදල් දීම... දෙවියන්වහන්සේගේ වැඩ වලට ඇතුලත්ය. ඔබ ඒවා අලසකමින් කරන්නෙහි නම් ඔබ ශාපවල උරුමය ලබයි. එපමණකුත් නොව ඔබේම ජීවිතය හිඟකමට පැමිණෙයි. **(හිතෝපදේශ 6:11)** බලන්න.

මෙන්න ඔබේ අලසකමට කුහුඹුවා ගෙන් පාඩමක්, ඌ ග්‍රීෂ්ම කාලයේ පයට පෑගෙමින් අව්වට වේලෙමින්, වෙහෙසෙමින් හාල්, හුණු සහල්, සීනි, කෑම, ධාන්‍ය, කැවිලි, කරවල කුඩු ආදිය ස්වකීය ගබඩාවට රැස් කරගනී. ඒවායින් එදිනෙදාට සෑහෙන පමණ පාවිච්චියට ගනන්නා කුහුඹුවා ඉතිරිය වැසි සමය සඳහා ප්‍රවේශමෙන් ගබඩා කර ගනී. තිබුන පලියට, නාස්ති නොකරයි. පමණ දැන ක්‍රියා කරන යහපත් දේව දරුවාගේ ශුද්ධාත්ම ඵලයක් වූ එම ගුණය **(ගලාති 5:23)** කුහුඹුවා ප්‍රකට කරයි. ඌ විශ්වාසවන්ත ගබඩාකාරයෙකි. ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නොදිරන මල නොබැඳෙන වස්තු රැස් කරන්නෙක් වනු දකින්නට යේසුස්වහන්සේ බලාපොරොත්තු වන සේක. **(මතෙව් 6:19 සිට 21 දක්වා).**

## උත්සහවන්තයා

කුහුඹුවෙක් බිත්තිය දිගේ නගිනු මම බලා සිටියෙමි. උගේ තුඩග වූයේ පාන් වාටි කැබැල්ලකි. එය කුහුඹුවාට බර වැඩිවූ නිසා වරින්වර කුහුඹුවා පෙරැලුණෝය. උං යළි නැගිට්ටේය. යළි පාන් වාටියට යටවී වැටුණෝය. මොහොතකින් යලි ඉන් බේරිගෙන පාන් කැබැල්ල ඇදගෙන යන්නට තැත් කළේය. උත්සාහය ව්‍යවර්ථ වූ තැන කුහුඹුවකු මුණගැසී තමාට අත්වූ වාසිය ගැන කීවේය. එහෙත් එය තමාට "බරවැඩි" බැවින් කොටස්කරුවකු වන ලෙස අනික් කුහුඹුවාට ඇරයුම් කළේය. උංද එකඟවිය. දෙදෙනාම පාන් වාටි කැබැල්ල ලඟට ආහ. උත්සහයක් දැරූහ. දෙදෙනාම වාටියට යටවූහ. යලි මතුවූහ. පළමුවැන්නා දෙවැන්නා පාන්වාටිය මුරයට තබා යලි ගමන් කළේය. හමුවූ කුහුඹුවන් සමග සාකච්ඡා කළේය. තවත් කුහුඹුවන් කිහිපදෙනෙකු කැඳවාගෙන ආවේය. පැයකට පමණ පසු මා දුටුවේ විශාල කුහුඹුවන් පිරිසක් විසින් එක්සත්ව ඔසවාගත් පාන් වාටිය බිත්තිය දිගේ බොහෝ ඉහළට ඇදී ගොස් ඇති බවකි. බදාගෙන රහසින් කෑමක් නැති කුහුඹුවා එක්සත්ව බෙදාගෙන කමින් කුම්මැහි, කුඩුකේඩු, තණ්හා අධික ලෝකයට සරදම් කරයි. **(හිතෝපදේශ 30:24,25 බලන්න)** කුඩා නමුත් ඉතා ඥානවන්ත වූ ජාතීන් සතරක් පොළවෙහි ඇත. කුහුඹුවෝ බල නැති සමූහයක්ය. එහෙත ග්‍රීස්ම කාලයෙහි උන්ගේ කෑම සපයා ගනිති.

## තෑගිදීම් හා සුසුම්ලෑම්

එක්සත්කම ඉතා වැදගත්ය. ඇදහිලිවන්තයා පරාර්ථකාමියෙක් විය යුතුය. **(ලූක් 6:35, ලූක් 6:38, ක්‍රියා 2:41, 2 කොරින්ති 9:7, ක්‍රියා 1:32)** ආත්මාර්ථකාමි ඇදහිලිවතා දෙවියන්වහන්සේට දුන් ත්‍යාග මුදල හෝ දසයෙන් කොටසද පොතක ලියා පසුව ගැන බලා සුසුම්ලයි. එසේ නැතහොත් උපකාර කිරීම උතුම් බව අන්‍යන්ට පහදා දෙමින් තමාගේ සාක්කු තරයේ පියවා ගනී. කුහුඹුවා එසේ නොවේ. ඒ කුඩා සතා ඥානවත් බවක් එසේම හිතවතුන්ගේ යහපත පිණිස ඕනෑ වූ විට ජීවිතය දෙන බවක් ඔබ සිතා බැලුවාද? කුහුඹු ගුලක් ලග ඔබ සිටින විට උගේ මාර්ගය අවහිර කිරීමට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරන කුහුඹුවා සිය තුඩගින් ඔබට දෂ්ඨකරයි. ඔබ කරන්නේ පාදවල එල්ලි සිටින කුහුඹුවන් වහාම ඉවතට ගසා පාගා දැමීම නොවේද? සිය ගණන් කුහුඹුවන් දිවි දෙමින් ගුල ඇතුලත සිටින කුහුඹුවන්ගේ රැකවරණය සලසාදීම කෙතරම් සිත් ගන්නා සුළුද? යේසුස් ස්වාමින්වහන්සේ ඔබ වෙනුවට පෑගුනෙත්, පහර ලැබුවෙත් මරණය වින්දෙත් ඔබට සාදාකාල මාවත පහදනු පිණිසය. නායකත්වය ඇති මිනිසා කැරළි ගසමින්, අලසවෙමින්, එක්සත්කම බිඳගන්නා අතර පුංචි කුහුඹුවා සිනාසෙනු ඇත. උං නායකයෙක් නැතිව කීකරුවෙමින්, කඩිසරව ක්‍රියාකරමින්, එක්සත්කම තහවුරු කරගන්නට තරම් ඥානයක් තිබේ. එබදු කඩිසරවූ, කීකරුකමින් හා එක්සත්කමින් ක්‍රියාකරන ඥානයක් අපිද ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ඉල්ලමු.

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# ජ්වලිත සීමොන් මෙන්න



සොලොස්වස් හෙවත් ජ්වලිතයා යන නම දරණ මෙම ප්‍රේරිතයා සැබවින්ම; සැමවිටම ඉතා උද්‍යෝගිමත් ප්‍රේරිතයෙකි සියල්ලෙහිදී ඔහු යේසුස්වහන්සේට යටත්ය. උන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් ඔහු සතුටු විය. එපමණක් නොවේ සමහරකු මෙන් ඕනෑම නිසා කරන පුද්ගලයකු වීමට ඔහු අසතුටු වෙයි. ජ්වලිතකමින් ඉතා උද්‍යෝගි මත්ව කරන දේ ඕනෑ කමින් කිරීමට සීමොන් මැලිනොවෙයි. කැපී පෙනීමට, උස්තැන්වල වාඩිවීමට ඔහු තුළ කැමැත්තක් නැත. ගෞරවණීය හෝ දේවධර්මාචාර්ය වැනි තනතුරක ආශ්වාදයක් විඳිනවාට වඩා මේ මනුෂ්‍යයා තිරයෙන් පිටුපස අප්‍රසිද්ධව හොඳ වැඩ කරන්නට ප්‍රියමනාපයක් දක්වයි. ඔහුගේ බලාපොරොත්තුව **"තමා අඩු වෙන්නටත් යේසුස්වහන්සේ වැඩියෙන් දැක්වීමටත්"** බැව් සක්සුදත් සේ පැහැදිලිය.

## *කානානිය සීමොන්*

ඔහු කානාන් ගමෙහි පුරවැසියෙකි. එහෙයින් ආරාමික භාෂාව ඔහුගේ මව්බස වන්නට ඇතැයි මම සිතමි. ඇතැම් බයිබල් විශාරදයන්ගේ මතයක් නම් සීමොන් යේසුස්වහන්සේ අදහාගෙන එතුමන් අනුගාමිකයෙක් වූයේ කානාහි සරණ මංගල්‍ය දින සිදුවූ වතුර මිදි පැන් කිරීමේ හාස්කම දෑසින් දැකීමෙන් හෝ ඊට සම්බන්ධවීමෙන්ය. සීමොන් යේසුස්වහන්සේ අදහාගෙන, උන්වහන්සේගේ අනුගාමිකයෙක් වූයේ නම් එයම අපට බලවත් ආදර්ශයක් වනු ඇත. වත්මන් ක්‍රිස්තියානින් තුළ ඇති බොහෝ දුබල තත්වයක් නම් **"පුදුම හා හාස්කම්"** බලමින් සතුටු වීමට වෙර දැරීමයි. එය පාපයක් නොවේ. එසේම දෙවියන්වහන්සේ තමන් පුත්‍රයාණන් තුළ ගෞරවය ලබමින් අදද බොහෝ දිව්‍ය පුදුම හා හාස්කම් අප අතරෙහි කරන සේක. එය සත්‍යයෙන් සත්‍යයකි. එසේ වෙතත් ඇදහිල්ල-පාපකමාව ගැළවීම ආදියට මූලාශ්‍ර වන්නේ පුදුම හෝ හාස්කම් නොවේ. ඇතැම්හු විවිධ ප්‍රසිද්ධ ආගමික මෙහෙයයන් බැලීමට යාම ආත්මික විනෝදාංශයක් කරගෙන සිටිති. ඔවුන් කොරුන් ඇවිදිනු දකින්ට, අන්ධයන් පෙනීම ලබනු දකින්ට ආශාවෙති. එය යහපත්ය. එහෙත් ප්‍රශ්නය වන්නේ මේවා දැකීමෙන් තව තවත් ආත්මය තෘප්තිමත් කරවීමට ඔවුන් හාස්කම් දෙසම **"ඇදහිල්ල"** තැබීමය. ඇදහිල්ල යනු නිතරම හාස්කම් දැකීම නොවේ. එයට වැඩි දෙයකි. හාස්කමක් ජීවිතය තුළ අභ්‍යන්තරිකව සිදුවී ඇති බවට (පාපි ස්වභාවය පහවී නව සමාදාන ස්වභාවයකට පැමිණි ඇති බවට හෝ නැවත උත්පාදනයට)

තමාටම සහතිකයක් තිබිම වඩාත්ම වැදගත්ය. භාස්කම් පසුපස ගියවුන් බොහෝවිට ඇදහිල්ල මදව සෝදිසි කරමින්ම මරණයට ළංවෙමින් සිටිති. දේව කැමැත්ත නම් තමා දකින පුදුම හා භාස්කම් තුලින් පවා දේවමහිමය අවබෝධ කරගනිමින් සීමොන් මෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමය. **"නුඹලා ලකුණුද පුදුමද නුදුටුවොත් විශ්වාස කරන්නේ නැත" (යොහාන් 4:48). "නොදැන මා විශ්වාස කරන්නෝ ආශිර්වාද ලද්දෝය" (යොහාන් 20:20).** මේ වදන් යේසුස්වහන්සේගේම හඬින. ඊට සවන් දෙමු. සීමොන් අවංකව එතුමන් අනුගමනය කරයි. ඔහු උන්වහන්සේ පසුපස යමින් සත්‍යතාවය වටහා ගනී. එයින් උද්‍යෝගිමත්ව ස්ථිර වෙයි. ඒ තුලින් බොහෝ භාස්කම් දෑසින් දකී, දෑතින් කරයි. **(මතෙව් 10:1 හා 10:4 බලන්න)**. එසේ වුවද ඔහුගේ කුරුමානම භාස්කම් මත සුවය හෝ පුදුම මත නොවේ. දිව්‍ය සුවය හා භාස්කම් අද ද සිදු වේ.

## උද්‍යෝගිමත් මිනිසා

කානානිය සීමොන් මෙන් කරන දේ අවංකවද, උනන්දුවෙන්ද කිරීමට අපි තරයේ අදිටන් කරගනිමු. **"නුඹලා මනුෂ්‍යයන් සතුටු කිරීමට මෙන් පෙනීමට වැඩ නොකොට, ක්‍රිස්තුස්වහන්සේගේ කැමැත්ත කරපල්ලා" (එපීස 6:6).**

සීමොන් පිළිබඳව අපට මුලින්ම **මතෙව් 10:4** කියවීමට පිළිවන. **මාර්ක් 3:18** යළිත් ඔහු හමු වෙයි. **ලූක් 6:16** හිද ඔහු ප්‍රේරිත ලැයිස්තුවේ සිටි. **ක්‍රියා 1:13** අප දකින්නේ ඔහු එක්සිත්ව, උඩුමහල් මැදුරේ 119 දෙනකු සමඟ සිටි බවය. යූදස් ස්කාරියොත් හැර අනිත් සියලුම ප්‍රේරිතයන්ද සමඟ ඔහු එකසිත දරයි. **"එකට කෑවත් බොක්ක වෙනස්"** යන සිංහල ප්‍රස්ථා පිරුළ ඔවුන් එකොළොස් දෙන බොරු කරති. **"මං එකට හිටියට ඔය යාච්ඤාවලදී එක්සිත් වන්න මට බැහැ. මම ආමෙන් කියන්නේ නැහැ"** - යනුවෙන් සිතන, කියන, සිත් ඔවුන්ට හෝ සීමොන්ට තිබුනේ නැත. ඔවුන් නායකත්වයට පොර බැදුවේ නැත. පසුව අමනාපව දොස් තබමින් ඇවිද්දේ නැත. පිටව අහක්ව ගියේ නැත. **(යොහාන් 2:18-19 බලන්න).** ඒ නිසාම ශුද්ධාත්ම බලය ඔහු තුලින් ක්‍රියාත්මක වෙයි. එබැවින් ශුද්ධාත්මයක් නැතැයි කීමට ඔහුට සිදු නොවේ. ශුද්ධාත්ම දීමනා මුලාවකැයි ඔහු පවසන්නේ නැත.

## තවත් සීමොන්ලා

මෙම ලිපිය අවසන් කරමින් සිහිපත් කළ යුතු තවත් වැදගත් කරුණක් වෙයි. එනම් පේත්‍රුස්ගේද මුල් නම සීමොන් බවය. එසේම තවත් සීමොන්ලා කිහිපදෙනෙකු අලුත් ගිවිසුමෙහි සිටිති. යේසුස්වහන්සේගේ සහෝදරයා වූ සීමොන් (මාර්ක් 6:3, මතෙව් 13:55) - පරිසියෙක්වූ සීමොන් (ලූක් 7:36, මතෙව් 26:6, මාර්ක් 14:3), කුරුසිය ඉසිලු කිරේතිය සීමොන් (මතෙව් 27:32, මාර්ක් 15:21, ලූක් 23:26) සම්කරුවෙකු වූ සීමොන් (ක්‍රියා 8:9, හා ක්‍රියා 8:18) ඔවුන්ගෙන් සමහරෙකි.

**- ප්‍රන්සිස් විජයසිංහ -**



# ආත්මික යුග පුරුෂ ප්‍රන්සිස් විජයසිංහ

**"දෙවියන්වහන්සේ වෙතින් එවන ලද යොහාන් නම් මනුෂ්‍යයෙක් ආවේය. ඔහු කරණකොටගෙන සියල්ලන් විසින් අදහන පිණිස ආලෝකය ගැන සාක්ෂි දෙන්නට ඔහු සාක්ෂි පිණිස ආවේය" (යොහාන් 1:6-7).**

මිනිස් ඇසුරින් වෙන්ව කානන්තාරයේ හැදී වැඩී වාසය කොට දෙවියන්වහන්සේගේ නියමකරන ලද කාලයේදී ජන සමාජය ඉදිරිපිට පෙනී සිට තම උතුම් සේවය ඉටු කළ යොහාන් බෞතීස්ත මෙන් වෙන්නප්පුවේ ප්‍රන්සිස් විජයසිංහ තම ජීවිතයේ තාරුණ්‍ය පසුවන තුරුම වැඩි දෙනා දැන හැඳින සිටියෙකු නොවේ. එවකට යුග දිවියට පිවිස සිටිය ඔහු උපතින් කතෝලික භක්තිවතෙකු විය. එම ආගමික සම්ප්‍රදායන්හි තදින්ම එල්බගෙන සිටි ඔහු මුණගැසීමට දිනක් ගුණපාල පින්නවල නමැත්තෙක් ඔහුගේ නිවසටම පැමිණියේය. වැල්ලවත්තේ, ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය මඟින් මුද්‍රණය කල "ලෝකාලෝකය" නමැති බයිබලීය සත්‍ය පළකරන සඟරාවේ සංස්කාරක මෙසේ තම නිවසට පැමිණීම පිළිබඳ ඔහු ප්‍රිය මනාප නොවීය. එම සඟරාව තැපෑලෙන් ගෙන්වා ගත්තත් එහි අඩංගු කරුණු ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූ ප්‍රන්සිස් විජයසිංහ, වැඩි ආගන්තුක සත්කාරයක් නොදක්වාම, ගුණපාල පින්නවල ආපසු පිටත් කර හැරියේය. ඔහු ඇත්තෙන්ම එහි ගොස් තිබුණේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන වන නව ජීවිතය පිළිබඳ කරුණු පැහැදිලි කර දීම පිණිසය. එයට සවන් දීමට ඔහු අකමැතිවූයේ තමා දැනටමත් නිවැරදි ආගමික සම්ප්‍රදායක් අනුගමනය කරන්නෙකු යයි තමා ගැන සිතූ නිසාය.

එහෙත් එදින රාත්‍රියේ සිදුවූයේ පුදුම දෙයකි. වෙනදා හොඳින් නිදාගන්නා ප්‍රන්සිස් විජයසිංහට එදින නින්ද ගියේ නැත. රාත්‍රී දෙගොඩහරියක් වන තුරු, දහවල් සිදුවූ දේ ගැනත් තමා මුණගැසීමට පැමිණි ආගන්තුකයා ගැනත් කල්පනා කරමින් ඔහු නිදි වැරුවේය. අවසානයේ ඔහු නින්දට වැටුණත් උදේ පාන්දර අවදිවන විට ඔහු සිටියේ ඇඳ මත නොව පොළව මතය. තවද තමාට උණ රෝගයද වැළඳී ඇති වග ඔහුට තේරුම් ගියේය. මෙවැනි අත්දැකීමක් මීට පෙර කවදාවත් ලබා නොතිබුණු ඔහුට මේ සිදුවීම, පෙරදා පැමිණි අමුත්තා සහ ඔහු ගෙනා පණිවුඩයට සම්බන්ධ බව සිතට සහතික වී තිබුණි. ගුණපාල පින්නවල නමැත්තා තමා වෙතට එවන ලද්දේ දෙවියන්වහන්සේ

විසින් බව ඔහුට ඒත්තු යන්නට විය. ඔහු පසු කලෙක පැවසූ ආකාරයට එවැනි අත්දැකීමක් ඔහු මීට පෙර කිසිදා ලබා තිබුණේ නැත. උණ පිටින්ම හැඳ පැළඳගත් ඔහු, තමා සොයා ගෙදර පැමිණි මිනිසා සොයා වැල්ලවත්තේ ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය වෙත පැමිණුණි. ප්‍රන්සිස් විජයසිංහගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එදිනයි. ඔහු ආදරයෙන් පිළිගත් ගුණපාල පින්නවල නැමැති කිතුණු සේවකයා ඔහුට සංග්‍රහකොට, වතගොත විමසා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ කරුණු පහදා දී, උන්වහන්සේගේ මරණයෙහි අභිප්‍රාය, එනම් උන්වහන්සේ කෙරෙහි අදහන්නන් පාප කමාව ලැබ සදාකාල ජීවනය ලැබීම යන සත්‍යතාව මැනවින් පහදා දුන්නේය. සම්ප්‍රදායික කතෝලික බැතිමතකු වූ ඔහු මෙම සත්‍යතාව මීට පෙර දැන සිටියේ නැත.

එදින ප්‍රන්සිස් විජයසිංහ සොයුරා අලුතින් ඉපදුණි. ඉන්පසු ගතවූ වසර 50ක පමණ කාල සීමාව තුල අප දුටු වේ "දෙවියන්වහන්සේ වෙතින් එවන ලද" මිනිසෙකි. ඔහු තම පවුල ගැලවීම උදෙසා ශුභාරංචිය ප්‍රකාශ කළේය. ඉන්පසු ගෙයින් ගෙට, ගමින් ගමට ශුභාරංචිය ගෙන යමින් මුලු වයඹ පළාතේම යේසුස්වහන්සේගේ සත්‍ය ශුභාරංචිය පතුරුවාලීමේ පුරෝගා මියෙක් විය. ඔහුගේ ජීවන සාක්ෂිය සහ බයිබලීය ශුභාරංචි ප්‍රකාශනය ඇසූ බොහෝ මිනිසුන් තම පව් කියාදෙමින් අලුත් ජීවනය ලබන පිණිස යේසුස්වහන්සේ වෙතට හැරුණි. වෙන්නප්පුව හා මීගමුව යන නගර දෙකේම කිතුණු සභා ආරම්භ විය. ඔහුගේ සේවය කරණකොටගෙන සැබෑ කිතුණුවෝ බවට පත් මිනිසුන් දහස් ගණනක් වෙතැයි කීම අතිශයෝක්තියක් නොවේ. ශ්‍රීලංකා කිතුණු ඉතිහාසයේ කිතුණු ශුභාරංචිය පදනම් කරගෙන ලියැවුණු පළමු "ගිරිලෙනක කථාවක්" යන නව කථාව ඔහුගේ කතෘත්වයෙන් එළි දිටීය. "බයිබලයේ සතුන්" යන මැයෙන් ඔහු විසින් ලියා මුද්‍රණය කළ පොත ඔහුට දෙවියන්වහන්සේ ලබාදුන් අපූරු ආත්මික ප්‍රඥාව පිළිබඳ සාක්ෂි දරයි. කිතුණු ගීත සහ ගීතිකා රාශියක් ඔහු විසින් රචනා කරන ලදී.

ඔහු යේසුස්වහන්සේ උදෙසා දුක් විදීය. නින්දා අපහාස සතුටින් දරා ගත්තේය. පුතුන් තිදෙනෙකුගේ පියෙක් වූ ඔහු තම ආදරණීය, සේවයටම කැපවූ බිරිඳ "බීටා" සමඟ දිගින් දිගටම යේසුස්වහන්සේට සේවය කළේය. දෙවියන්වහන්සේට අවංකව කැපවුණු මිනිසෙකු කරණකොටගෙන උන්වහන්සේට සිදුකල හැකි සේවයක තරම අපි ඔහු හරහා දුටිමු. මේ අයුරින් තම ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සේවය කළ ප්‍රන්සිස් විජයසිංහ සොයුරා පසුගිය දා සවර්ගස්ථ විය. දෙවියන්වහන්සේට සියලු මහිමය වේවා!

**- නෙවිල් ජයසුන්දර -**

# මහත් ප්‍රීති උපදවන ආරංචිය

**"පියෙක්වත්, මවෙක්වත්, පෙළපතක්වත්, දවස්වල පටන්ගැන්මක්වත්, ජීවිතයේ කෙළවරක්වත් නැත්තාවූ මේ තෙමේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාට සමාන කරනු ලැබ......." (හෙබ්‍රෙව් 7:3).**

අපගේ ගැළවුම්කරුවාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ පැවැත්ම හා තත්ත්වය මෙයයි. උන්වහන්සේ අතීත සදාකාලයේ සිට අනාගත සදාකාලය දක්වා වැඩවසන සේක. උන්වහන්සේ පටන්ගැන්මක්වත් අවසානයක්වත් නැති දෙවියන්වහන්සේය. ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවැනි තැනැන්වහන්සේය. මේ තමයි දේව වචනයට අනුකූලවූ සත්‍යතාවය. එවන් අති උත්තම, උත්කෘෂ්ඨ තැනැන්වහන්සේ මාංසවත්වී මනුෂ්‍යයන් අතරට පහළවීම අපූරුවූ ඓතිහාසික සිදුවීමකි.

**"පටන්ගැන්මේදී වාක්‍යාණෝ සිටිසේක, වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටි සේක, උන්වහන්සේ පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ සමඟ සිටිසේක" (යොහාන් 1:1-2).**

**"තවද වාක්‍යාණෝ මාංසවත් වී කරුණාවෙන්ද, සත්‍යයෙන්ද, පූර්ණව අප අතරෙහි වාසය කලසේක" (යොහාන් 1:7).**

එතුමාණෝ ඓශ්වර්යමත් තේජශ්‍රීයෙන්ද, දිව්‍යමය වූ අලංකාරයෙන්ද පරිපූර්ණව දේවදූත සේනාවන්ගේ නිරන්තර නමස්කාරය ලබමින් වැඩවාසය කල අනන්ත අප්‍රමාණවූ තැනැන්වහන්සේ වන නමුත් ඒ සියල්ල ඉවත්කර, ස්වර්ගයද අත්හැර මනුෂ්‍ය ශරීරයකින් පැළදී බිළිඳකු සේ මෙලොව උපත ලැබීම කෙතරම් විශ්මයජනක කාරණයක්ද? මේ ගැන අපි කොපමණ ගැඹුරට සිතා මෙනෙහි කළ යුතු වන්නේද? තම පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව, දෙවියන්වහන්සේ විසින්ම සදාකාලයේ පටන් ආලේපකරනු ලැබ, නියම කරනු ලැබ මෙලොවට එවීම උන්වහන්සේගේම සැලැස්මයි.

අද ක්‍රිස්තියානි ලෝකයේ සෑමදෙනාම **"නත්තල"** කියා සමරන්නාවූ මෙම දිනය දෙවියන්වහන්සේ විසින්ම නියම කළ දිනයයි. **"නමුත් කාලය සම්පූර්ණ වූ කල දෙවියන්වහන්සේ ස්ත්‍රියකුගෙන් උපන්නාවූ ද, ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද තම පුත්‍රයාණන් එවූ සේක" (ගලාති 4:4).** මෙම දිනය මනුෂ්‍යයන් විසින් උපකල්පනය කරගත් පරිදි දෙසැම්බර් 25 වන දා සමරන නමුත් උන්වහන්සේගේ උපත නිශ්චිතව සිදුවූයේ කවදාදැයි කවරෙකුදු නොදනී. වසරෙන් වසර නත්තල සමරන ඔවුන්, ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියෙහි සැබෑ අරුත සහ අරමුණ කුමක්ද කියාවත් තේරුම් නොගෙන බොහෝ දෙනා එම දවස නිකම්ම නිකම් සම්ප්‍රදායික උත්සව දිනයක් බවට පත්කරගෙන සිටිති. අද එම විශේෂිත දවසේ කිතු බැතිමතුන් ප්‍රධාන කරගත් දේවල් වන්නේ, ඉතා ඉහළින්ම අලංකාර ලෙස හැඳපැළඳගෙන දේව මෙහෙයට සහභාගී වීම, **"නත්තල්"** රසවත් කෑම බීම රසවිඳීම, නත්තල් සැරසිලි, නත්තල් ගීත, නත්තල් තෑගි බෝග ආදියයි. මේ දේවලින් තමන්ව සතුටු කරගනිති. තෘප්තියට පැමිණෙති. දේව මෙහෙයේදී පූජකයා විසින් අනිවාර්යයෙන්ම කියවනු ලබන්නාවූ මෙම දේව වචන කොටස්,

එනම්,

**"බලව, කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය. උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත" (මතෙව් 1:22).**

**".... ඒ නාමයේ (එම්මානුවෙල්) අර්ථය නම් දෙවියන්වහන්සේ අප සමඟය යනුයි" (මතෙව් 1:23).**

ඔවුන් විසින් කන්දෙනු ලබන්නේ නැත. නැතහොත් එම දේවවචනය මුලුමනින්ම, ඕනෑකමින් අමතක කර දමනු ලබති. ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණීමේ ආශිර්වාදය සදාකාලයටම අහිමි කරගනිති. මෙලෙස කිතුබැතිමතුන් බොහෝ දෙනා දේවරාජ්‍යය අබියසම තමන්ගේ කැඳවීම, සදාකාල ජීවනය නොමැතිව භයානක නිරාගින්නේ දොරටුව තමන්ටම විවෘත කර ගනිති.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉපදුණ එම දවසේ ස්වර්ගයෙන් පැමිණි දේවදූතයා එඬේරුන්ට පැවසුවේ "**.......... මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි. මක්නිසාද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැලවුම්කාරයෙක් නුඹලාට අද උපන් සේක"** කියාය. එසේ නම් එම ආරංචිය ක්‍රිස්තියානි ජනතාවට පමණක් නොව, මුළු සෙනඟට, මුළු ලෝකයාටම මහත් ප්‍රීති උපදවන ආරංචියකි. ඇයි ඒ? උන්වහන්සේ මුළු ලෝකවාසී සෑමදෙනාටම ගැළවීම ලබාදෙන පිණිස ගැලවුම්කරුවාණන් ලෙස ඉපදුන නිසාය. එම ප්‍රීතිය අද නත්තල් දවසට පමණක් සීමාවූ තාවකාලික ප්‍රීතියක් නොවෙයි. එය අපගේ ජීවිතයට ලබාගත හැකි, පවතින සදාකාලික ප්‍රීතියකි. පව්කාර වූ අපගේ පාප උදෙසා දඬුවම ලබන්නට ඉදිරිපත් වී මෙලොවට පැමිණි උන්වහන්සේ, එම ප්‍රීතිය, එම මහත් ප්‍රීතිය අපට ලබාදෙන්නට කැමතිවූසේක.

**"ඈ පුත්‍රයෙකු වදන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබන්න; මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේය" (මතෙව් 1:21).** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයේ උන්වහන්සේට තිබුණාවූ මහිමය, ගෞරවය, ප්‍රශංසාව, ශ්‍රේෂ්ඨභාවය, දේවත්වය පසෙක තබා මෙලොවට පැමිණියේ ඇයි දැයි අපගෙන්ම ප්‍රශ්ණ කරගත යුතු වේ. මක්නිසාද මෙම සත්‍යතාවය තේරුම් ගැනීම, පිළිගැනීම අප සැමදෙනාටම ඉතාමත් වැදගත් කරුණකි. ඔබටත් මටත් ඇති ප්‍රේමය නිසාම උන්වහන්සේ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන **"පාප රහිතව"** පිළිසිඳිණු ලැබ මෙලොව උපත ලැබූසේක. පාප බීජය නොමැතිව ඉපදුණු එකම මනුෂ්‍යයාවූ උන්වහන්සේ අපගේ පාපවල දඬුවම කුරුසියක් මත ගෙවා අපට ස්වර්ග රාජ්‍යයට ස්ථිර ලෙස ඇතුළුවීමට වරප්‍රසාද ලබාදුන් සේක. සදාකාල ප්‍රීතිය හා සදාකාල ජීවනය ලබාදුන් සේක. අද ලෝකයේ අය නත්තලේ ප්‍රීතිය ලබන පිණිස සම්ප්‍රදායිකව හැඩගැසී තිබෙන නත්තල් වංචාවෙන් ගැළවෙන්නටම අවශ්‍යයි. නැතහොත් ඔබ එම වංචාවෙන් ඔබවම රවටා ගනිමින් සදාකාලික මරණයෙන් විනාශ වෙනවා ඇත. ප්‍රිය මිතුර, මිතුරිය, මේ දැන් යේසුස්වහන්සේට කතාකරන්න. උන්වහන්සේ මළවුන් ගෙන් නැගුටුවනු ලැබ ස්වර්ගයට ඔසවා ගනු ලැබූ සේක. ඔබගේ පාපවලට සමාව දෙන්න සූදානම්ව සිටින සේක. මේ දැන් උන්වහන්සේව ඔබගේ සිතට පිළිගෙන, සදාකාලික ප්‍රීතිය ලබාගන්න. උන්වහන්සේ මෙලොවට බිහිවුනේ මෙම ප්‍රීතිය ඔබට උදාකර දෙන පිණිසය.

**- ඒ. ජේ. ජයසුන්දර -**

# ස්ත්‍රීන් අතරෙහි ආශිර්වාදලද්දී ආශිර්වාදයක් වූ සැටි.



ශුද්ධ බයිබලයේ උත්පත්ති පටන් එළිදරව් දක්වා පොත් තුලින් යනවිට බොහෝ කාන්තාවන් අපට මුණ ගැසේ. ඔවුන් අතරින් සමහරු භක්තිවන්ත අය වන අතර සමහරු අභක්තික වෙති. මේ අය ගැන සලකා බැලීමේදී ඔවුන්ගේ චරිත ගැන වෙන වෙනම පාඩම් අපට ඉගෙන ගත හැකි වේ. මේ අතරින් දෙවියන්වහන්සේගේ සේවයෙහි විශේෂ කැපීපෙනෙන චරිත ඇති කාන්තාවන්ද අපට හමුවේ. මෙවැනි කාන්තාවන් ගැන අධ්‍යයනය කිරීම අපට ප්‍රයෝජනවත්ය. එම නිසා අපට ඉඩ ලැබෙන ආකාරයට එවැනි කාන්තාවන් ගැන අපි ඉගෙන ගනිමු.

මෙම නත්තල් සමයේ යේසුස්වහන්සේගේ උත්පත්තිය විශේෂයෙන් සිහිකරන නිසා, උන්වහන්සේගේ උපත සම්බන්ධව වැදගත්ම ස්ථානය ගන්නාවූ මරිය තුමිය ගැන අපි සළකා බලමු. එතුමි දෙවියන්වහන්සේගෙන් බොහෝ කරුණා ව ලැබූ තැනැත්තිය ලෙස දේව වචනයේ සඳහන්ය. දෙවියන්වහන්සේ එතුමිව තෝරාගත්තේ උන්වහන්සේගේ විශේෂ අභිප්‍රායක් ඇගේ ජීවිතයේ ඉෂ්ඨ කරන පිණිසය. මරියතුමීගේ ජීවිතයෙන් අපට බොහෝ දෑ ඉගෙන ගතහැක. ප්‍රධාන කොට අපි එතුමිය තුලින් ඉගෙන ගන්නේ දෙවියන්වහන්සේගේ අභිප්‍රායට මුළුමනින්ම යටත්වූ තැනැත්තිය ලෙසටයි. බොහෝ වේලාවට අපි දෙවියන්වහන්සේගේ අභිප්‍රාය හෝ කැමැත්තට යටත් වීම සම්බන්ධව අවබෝධයක් නැතිව සිටින්නෙමු. එසේත් නැතිනම් එම කාරණය මග හරින්නෙමු. අපි කැමතියි යම් යම් සේවයන් කිරීමට. එනම් ළමා සේවය, ගායනා සේවය, ඉගැන්වීමේ සේවය, එකිනෙකාට උපකාර කිරීමේ සේවය යනාදී වශයෙන්. නමුත් දෙවියන්වහන්සේ අප තුලින් හා අප කරණකොටගෙන කරන්නට කැමති වන්නාවූ උන්වහන්සේගේ අභිප්‍රායන් ගැන අපි සිතන්නේ නැත.

ගාබ්‍රියෙල් දේවදූතයා මරියතුමියව මුණගැසෙන්නට පැමිණෙන විට ඇය ඉතාමත් ලාබාල වියේ පසුවූ අවිවාහක තරුණියක්. දේවදූතයා ගෙනාවේ අමුතුම ආකාරයේ පණිවුඩයක්. එනම් එතුමිය ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන ගර්භණියක් වන්නට යන බවය. මෙම පණිවිඩය ක්ෂණයකින්ම ඇය තුල ඉමහත් බයක් හා තැතිගැන් මක් පමුණුවන්නට ඇත. අවිවාහක තරුණියකට දරුවකු ලැබෙන්නට යනවා යැයි කී විට එවැනි මහත් අපහසුතාවයක ට පත්වීම ස්වභාවික දෙයකි. නමුත් එතුමි එම බිය හා තැතිගැන්ම අභිබවා ඒ අමුතු පණිවිඩයට ඒ හා සමානව අසාමාන්‍ය පිළිතුරක් දුන්නාය. **(ලූක් 1:38) "බැලුව මැනව, ස්වාමීන්වහන්සේගේ දාසිය, ඔබගේ වචනය ලෙස මට වේවා".** දෙවියන්වහන්සේගේ සැලැස්මට, අභිප්‍රා යට හා කැමැත්තට අපවම යටත් කිරීම

ඉතාමත් අසීරු කාර්යයකි. බොහෝවිට අපි දෙවියන්වහන්සේගේ සැලසුමට කැමති නැත. අපි යාච්ඤා කරන්නේ දෙවියන්වහන්සේගේ සැලසුම තුල නැති දේවල් ගැනය.

මෙහිදී අපට දක්නට ලැබෙන්නේ දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන්ට මෙලොවට ගෙන ඒමට සැලසුම් කල ආකාරයයි. උන්වහන්සේට අවශ්‍ය කර තිබුණේ උන්වහන්සේගේ සැලසුමට විරුද්ධ වෙන්නේ නැති නියම ඇදහිල්ලේ කාන්තාවක්. එතුමියගේ ගර්භණීභාවය අන් අය දැනගත් විට එතුමිට මුහුණ පෑමට සිදුවන නින්දා, අපහස හා අවමාන ගැන එතුමී හොඳාකාරයෙන් දැන සිටියා. ඒ ඇයිද කිවහොත් එතුමී දරුවකු බිහිකරන්න යන්නේ විවාහයට පිටින් වන නිසයි. මොනතරම් අවනම්බුවක්ද? නමුත් ඒ සෑමදේට ඉහලින් ඇගේ චරිතය තුලින් දිස්වූයේ ඇදහිල්ලේ ක්ෂණික දර්ශනයයි. ඇය එකත්පසව කියා සිටියේ, **"ඔබගේ වචනය ලෙස මට වේවා"යි** කියාය. මෙලෙස මරියතුමී දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වූ අවස්ථාවේ පහත සඳහන් අනතුරු සහිත අත්දැකීම්වලට මුහුණ පෑවාය. පළමු අනතුර නම් එතුමී නරක චරිතයක් ඇති තැනැත්තියක් ලෙස චෝදනා ලබන්නට ඉඩ තිබුණි. දෙවනුව ඇය සමඟ විවාහ ගිවිසගෙන සිටි යෝසෙප් ඇය ගර්භණීවූ බව දැනගත්විට එම ගිවිසගැනීම අවලංගු කිරීමට ඉඩ තිබුණි. **(මතෙව් 1:18-19).** තුන්වෙනුව පරණ ගිවිසුමේ ව්‍යවස්ථාවට අනුව එතුමියට ගල්ගසා මරණයට පත් කිරීමට ඉඩ තිබුණි. එතුමී මේ ඕනෑම දේකට මුහුණ දෙන්නට සූදානම්ව සිටියාය.

දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ අභිප්‍රායන් ඉෂ්ඨ කිරීම සඳහා අනතුරුදායක තත්ත්වවලට මුහුණ දෙන්නට සූදානම් වූ, කැපකිරීම් කරන්නට කැමතිවූ ස්ත්‍රීන් අදත් සොයමින් සිටින සේක. උන්වහන්සේට අවශ්‍ය කරන්නේ අපගේම සැප පහසු තත්ත්ව වලින්, ස්ථානවලින් පිටතට ඇවිත් උන්වහන්සේ උදෙසා වැඩ කරනවාටයි. එවැනි ආකාර කාන්තාවන් ගැන උදාහරණ ශුද්ධ බයිබලයේ අපට සිටිති. මෝවබීය රූත්, යෙරිකෝවේ වෛශ්‍යාවවූ රාහාබ්, අනාගතවාක්තෘවරියක් වූ දෙබෝරා, අළුත් ගිවිසුමේ මග්දලායේ මරියා, පිලිප්පියේ ලිදියා, මින් සමහරෙකි. තවත් එවැනි උතුම් ස්ත්‍රීන් ගැන සභා ඉතිහාසයේද කියවිය හැක. ඔවුන් සැමදෙනාම යම් මිලයක් ගෙවීමට සූදානම්ව සිටියහ. එසේ නම් ස්ත්‍රීන් වන අපි, අපගේ පවුල, අපගේ දරුවන් පමණක් ගැන සිතමින් ඒ ගැන පමණක් යාච්ඤා කරමින් නොසිට, අද අපි මරිය තුමියගෙන් ඉගෙනගත් පරිදි අපගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය, කැමැත්ත, සැළැස්ම කුමක්ද කියා සැළකිලිමත් වෙමු. එතුමී දෙවියන්වහන්සේගේ අභිප්‍රායට යටත්වී එයට මූලික තැන දුන් නිසා මුළු ලෝකයාටම මහත් ආශිර්වාදයක් වූ යේසුස්වහන්සේව මෙලොවට ගෙන ඒමට උපකාරී වූවාය. අද අපි එම මහත් ආශිර්වාදය, වරප්‍රසාදය භුක්තිවිඳින්නෙමු. එමනිසා අපිත් දෙවියන්වහන්සේගේ අභිප්‍රායට, කැමැත්තට යටත්වී ඊට එකඟව ක්‍රියා කිරීමෙන් අපටත් බොහෝ දෙනෙකුට ඉමහත් ආශිර්වාදයක් විය හැක. එසේ කිරීමට උන්වහන්සේ කාන්තාවන් වන අපට උපකාර කරන සේක්වා!

**- ඈන් ජයසුන්දර -**

# දෙවියන්වහන්සේගේ කරුණාවේ ලක්ෂණ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලි වන්තයන් වන අප, දෙවියන්වහන්සේගේ විවිධ ගුණාංග අත්දකින්නෙමු. දෙවියන් වහන්සේගේ ප්‍රේමය, අනුග්‍රහය, කරුණාව සහ විශ්වාසවන්තකම ඒ ගුණාංගවලින් කිහිපයකි. කිතුනු ඉතිහාසය පුරාවට මේ ගැන බොහෝ දෙනෙක් දේශනාකර ලියා තිබෙන අතර කවි සහ ගීතිකා නිර්මාණය කර තිබුනත්, අප කිසිවෙකු දෙවියන්වහන්සේගේ ගුණාංග සම්පූර්ණ යෙන් අවබෝධ කර ගැනීමටත් ඒවා පහාදා දීමටත් අසමත්ව සිටින බව අප තේරුම් ගත යුතුය.

අපි දෙවියන්වහන්සේගේ කරුණාවේ (MERCY of God) ලක්ෂණ කිහිපයක් සලකා බලමු. බොහෝ විට අපි දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ගැන බොහෝ දේවල් කතා කරන්නෙමු. නමුත් දෙවියන්වහන්සේගේ කරුණාව ගැන ඇති තරම් කතා කිරීමට අපි අපොහොසත් වෙමු. අනුග්‍රහය (GRACE) යනු, **"අපි දෙවියන්වහන්සේගෙන් ලබන්ට වටින්නැති දේ (සමාව) දෙවියන්වහන්සේ අපට ලබා දීමයි"**. කරුණාව (MERCY) යනු, **"අපි දෙවියන්වහන්සේගෙන් ලැබිය යුතු දෙය (විනිශ්චය) නොලැබීමයි"**. කිංග් ජේම්ස් ඉංග්‍රීසි අනුවාදයෙහි දෙවියන්වහන්සේගේ කරුණාව ගැන විස්තර කිරීමට විවිධ වචන භාවිත කර තිබෙන බව පෙනී යයි. අනෙක් පරිවර්තන සහා භෂාවන්හි ඊට වෙනස් වචන පාවිච්චි වෙන නමුත් ඉංග්‍රීසි කිංග් ජේම්ස් පරිවර්තනයට අනුව දෙවියන්වහාන්සේගේ කරුණාවේ ලක්ෂණ කිහිපයක් දෙස බලා, ආත්මික ගුරුහරුකම් ලබමු.

## 1. බහුල කරුණාව (ABUNDANT MERCY) - 1 ජේතෘස් 1:3

දෙවියන්වහන්සේගේ කරුණාවේ පළමු විස්තරය මෙම පදයෙහි සඳහන් වේ. මෙම පදය අපට දෙවියන්වහන්සේගේ බහුල කරුණාව ගැන කතා කරන අතර, එය අපගේ ගැලවීමට සම්බන්ධව සඳහන් වී තිබේ. අපි දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන ගැළවී සිටින බව බොහෝ විට අසා දැන සිටින්නෙමු. අපගේ ගැලවීම සම්බන්ධව දෙවියන්වහන්සේගේ සැලසුම අපගේ ජීවිත වල ඉටුවන පිණිස උන්වහන්සේගේ අනුග්‍රහය වැදගත් වන්නාසේම, ඊට සමානවම දෙවියන්වහන්සේගේ කරුණාවද වැදගත් කාර්ය භාරයක් ඉටු කරන බව අප තේරුම් ගත යුතුය. ගැලවීම ලැබීම සඳහා අපට දෙවියන්වහන්සේගේ කරුණාව බහුලව තිබූ බව, මෙම පදයෙහි සඳහන් වේ.

අපගේ පව් උදෙසා අපට උරුම දඬුවම අපට නුදුන් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ බහුල කරුණාව කරණකොටගෙන අප ගැලවූ සේක. මා මෙය ඉතා සරලව පැහැදිලි කරන්නේ නම් ඒ මෙසේය, දෙවියන්වහන්සේගේ බහුල කරුණාව සියළු දේම යටකරගෙන යන සුනාමියක් වගේ ක්‍රියා කරන්නේය. එනම් අපගේ සියළු පාපිෂ්ඨ බව සහ කාලකණ්ණි බව සහමුලින්ම යටකරගෙන අපව පාපයෙන් ගලවන්නට දෙවියන්වහන්සේගේ බහුල කරුණාව ක්‍රියා කළෙහිය. මෙම දෙවියන්වහන්සේගේ බහුල කරුණාව නොවන්නට අපගේ පාප සඳහා අපට උරුම වී තිබුණු දඬුවමට යටත් වන්නට සිදුවෙයි.

ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ මෙම බහුල කරුණාව ඔබ අත්දැක තිබෙනවාද? ඔබ ඔබගේ පාප ඒත්තු ගෙන, පසුතැවිලිවී, පාපොච්චාරනය කර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් සමාව අයද, උන්වහන්සේව ඔබගේ හදවතට ආරාධනා කරන්නේ නම්, ඔබටත් ගැලවීම ලබා දෙවියන්වහන්සේගේ බහුල කරුණාව සම්පූර්ණයෙන් අත්දැකිය හැක.

## 2. මෘදු කරුණාව (TENDER MERCY) - ගීතාවලිය 51:1

දෙවියන්වහන්සේගේ කරුණාව ගැන දෙවන විස්තරය මෙහි සඳහන් වේ. **ගීතාවලිය 51** දාවිත්ගෙ ගීතයක් ලෙස ප්‍රසිද්ධ වේ. මෙම ගීතිකාව ලියනු ලැබුවේ, දාවිත් බැත්ශෙබා සමඟ කාමමිත්‍යාචාරයේ පාපයේ යෙදී, ඇයගේ අහිංසක ස්වාමිපුර්ෂයා මැරීම ගැන පසුතැවිලිවිමෙන් පසුවය.

අනාගතවක්තෘ නාතාන් දාවිත්ගේ පාපය ගැන ඔහුට පෙන්වා දීමෙන් පසු, දාවිත් සැබෑ ලෙස තම පාපය ගැන පසුතැවිලි වී දෙවියන්වහන්සේගේ මෘදු කරුණාව පමණක්ම කෙරෙහි සම්පුර්ණයෙන් යැපුනේය.

දාවිත් දැන සිටියා ඔහුගේ පාපය මොන තරම් බරපතල සහ බිහිසුණු වුනත්, දෙවියන්වහන්සේගේ කරුණාව ඔහුට සමාව දී නැවත සමගිකිරීම ගෙන ඒමට තරම් මෘදු බව. අපි අපේ සිත් තද කරගෙන දෙවියන්වහන්සේට විරුද්ධව පව් කළත්, අපේ පව් ඒත්තුගෙන පසුතැවිලිවි පාපොච්චාරනය කරනවිට, දෙවියන්වහන්සේගේ කරුණාබරිත හදවත උණුවි, අපට සමාව දෙන්නට තරම් දෙවියන්වහන්සේගේ කරුණාව බොහෝ මෘදුය.

අද දවසේ පවා ඔබ පසුතැවිලිවන හදවතක් ඇතුව උන්වහන්සේ වෙතට යන්නේ නම්, උන්වහන්සේගේ මෘදු කරුණාව ඔබ වෙනුවෙන් සූදානම්ව තිබේ. ඔබට දෙවියන්වහන්සේගේ මෘදු කරුණාව අත්දකින්නට අවශ්‍යද? එසේ නම් ඔබේ පාපය කෙතරම් බරපතල වුවත්, පසුතැවිලිවන හදවතක් ඇතුව උන්වහන්සේ වෙතට ළඟා වී දෙවියන්වහන්සේගේ මෘදු කරුණාව අත්දකින්න.

## 3. මහත් කරුණාව (GREAT MERCY) - (ගීතාවලිය 103:11)

දෙවියන්වහන්සේගේ කරුණාව පිළිබඳ තුන් වන විස්තරය මෙම පදයෙහි සඳහන් වේ. එනම් දෙවියන්වහන්සේගේ මහත් කරුණාවයි. ස්වර්ගය පොලොවට වඩා උසස්ව තිබෙන්නාක් මෙන් දෙවියන්වහන්සේගේ කරුණාව මහත්ය. දෙවියන්වහන්සේගේ මහත් කරුණාව අත්දැකීමේ පසුබිම 10 වන පදයෙහි සඳහන් වේ . උන්වහන්සේ අපේ පාපවල ප්‍රකාරයට අප කෙරෙහි ක්‍රියා නොකර උන්වහන්සෙගේ මහත් කරුණාව පරිද්දෙන් අප ගැන ක්‍රියා කරන සේක. **"අප විනාශ නුණේ ස්වාමින්වහන්සගේ කරුණාවල් නිසාත්"** යනුවෙන් **විලාප ගී 3:22** හි අප කියවනු ලබමු. දෙවියන්වහන්සේ අපගේ පාප ප්‍රකාරයට ක්‍රියා කර තිබුණේ නම් අප තුළ කිසිවක් ඉතුරුවන්නේ නැත.**"නුඹේ ඇස නුඹට බාධා කෙරේ නම්, ඒක උගුල්ලා අහකට දමන්න, අත බාධා කරන්නේ නම් එය කපා අහකට දමන්න"** යනුවෙන් මතෙව් ශුභාරංචියෙහි අපි කියවමු. තව දුරටත් මෙම නියමයට අනුව අප ක්‍රියා කලේ නම්, අප ශරීරයෙහි කිසි අවයවයක් ඉතිරි නැති වන ලෙස කපා කොටා ඉවත් කළ යුතු වේ. නමුත් එසේ අපගේ පාප ප්‍රකාර අප සමඟ ක්‍රියා නොකර, උන්වහන්සේගේ මහත් කරුණාව පරිද්දෙන් අප ගැන ක්‍රියා කරන බැවින් දෙවියන්වහන්සේට ස්තූති වේවා.

## 4. අධික/බොහෝ කරුණාව (MULTITUDE OF MERCY) - (ගීතාවලිය 106:45)

දැන් අපි දෙවියන්වහන්සේගේ කරුණාව ගැන හතර වන කොටසට යොමු වෙමු. එය නම් දෙවියන්වහන්සේගේ අධික/බොහෝ කරුණාවයි. අධික යන්නෙහි නිර්වචනය නම් ගණනින් බොහෝ යන්නයි. දෙවියන්වහන්සේගේ කරුණාවත් ගණනින් බොහෝය. **ගීතාවලිය 106 හි** ඉශ්‍රායෙල් ජනතාවගේ වැටීම්, අසමත්වීම් සහ පසුබෑම් වලින් පිරී තිබෙන බව අපට කියවීමට පුළුවන. මෙවැනි වාතාවරණයන් හිදී දෙවියන්වහන්සේගේ අධික/බොහෝ කරුණාව සඳහන් වේ . කෙතරම් වතාවන් ඉශ්‍රායෙල් ජනතාව අසමත්වී වැටී තිබුනත්, දෙවියන්වහන්සේගේ අධික/බොහෝ කරුණාව ඔවුන්ට සමාව දී ඔවුන් නැවත නගා සිටුවන්නට ගණනින් අධිකව තිබුණේය.

අද දවසේදී ඔබටත් මටත් දෙවියන්වහන්සේගේ අධික/බොහෝ කරුණාව ගැන විශ්වාසය තැබිය හැක. අද දවසේදී ඔබගේ ජීවිතය කෙසේද? ඔබේ ජීවිතයත් බොහෝ වැටීම් සහ වැරදීම් සනිටුහන්ව තිබෙනවාද? එසේ නම් අධික/බොහෝ කරුණාවෙන් යුක්තව ඔබට පිහිට විය හැකි දෙවියන්වහන්සේව විශ්වාස කරමින් උන්වහන්සේගේ අධික/බොහෝ කරුණාව වෙතට හැරෙන්න.

## 5. අනේකාකාර කරුණාව (MANIFOLD MERCY)

**- (නෙහෙමියා 9:19)**

දෙවියන්වහන්සේගේ කරුණාවේ 5 වන විස්තරය වන්නේ දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවයි. දෙවියන්වහන් සේගේ කරුණාව ගැන විස්තර කිරීමට යොදා ගන්නා සමහරක් වචන සමාන තේරුම් ඇති බව හැඟෙයි. නමුත් අපි ඉතා පරීක්ෂාකාරීව එම වචන සහා එහි පසුබිම මෙනෙහි කරන විට, සැබවින්ම අපට ආත්මික ගුරුහරුකම් ලබාගත හැක. මෙහි අපට දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ විවිධ ලක්ෂණ ගැන සඳහන් වේ.

දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණා ව ගැන තව දුරටත් අවදානය යොමු කිරීමේදී, මෙම පදයෙහි ලක්ෂණ 3 ක් හඳුනා ගත හැක.

### ⋆ ආරක්ෂාව - නෙහෙමියා 9:19

මෙහිදී දෙවියන්වහන්සේ අනේකාකාර කරුණාවෙන්, මුළු කාන්තාර ගමන පුරාවටම ඉශ්‍රායෙල් ජනතාව වළා ටැඹකින් සහ ගිනි ටැඹකින් දෙවියන්වහන්සෙ ආරක්ෂා කළ සේක.

### ⋆ සැපයීම - නෙහෙමියා 9:20

දෙවියන්වහන්සේ අනේකාකාර කරුණා වෙන් ඉශ්‍රායෙල් ජනතාව ආරක්ෂා කළා පමණක් නොව, උන්වහන්සේගේ අනේකාකාර කරුණා ව කරණකොටගෙන කාන්තාර ගමන පුරාවට ඔවුන්ට සපයා ද දුන් සේක.

### ⋆ සැලකිල්ල - නෙහෙමියා 9:21

අනේකාකාර කරුණාවේ තවත් එක් ලක්ෂණයක් නම් උන්වහන්සේගේ සැලකිල්ලයි. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට කිසි අඩුපාඩුවක් නොවන පිණිස ඔවුන් ගැන සැලකූ සේක. ඔවුන්ගේ ඇඳුම් පරණ වුනේ වත් ඔවුන්ගේ පාද ඉදිමුනේ වත් නැත.

දෙවියන්වහන්සේගේ කරුණාව අනේකා කාර වන අතර, එය විවිධාකා රයෙන් අප ජීවිත සම්බන්ධව පිහිටවන්නේය. දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාව අත්දැකීම තුලින් උන්වහන්සේගේ ආරක්ෂාව, සැපයීම සහ සැලකිල්ල ඔබ අත්දැක තිබේද?

මතු සම්බන්ධයි

**- දිනේෂ් මැල්කම් පෝල් -**

# අප උදෙසා වූ ශ්‍රේෂ්ඨ උපතක්

වසරක අවසාන මස වන දෙසැම්බර් ලබත්ම ඊට කඩිනමින් සැරසෙති. බොහෝ නිවැස් අලුත් තීන්ත ආලේප කොට අලුත් වැඩියා ද කරනු ලබති. එහෙත් මේ දිනය පිළිබඳව ඔවුන් තුළ පවතිනුයේ නිවැරදි ආකල්පයක් නොවන අතර නිවැරදි දේ පිළිබඳ දැනගැන්මට පැමිණීම ඔවුන් තවමත් සූදානම් නැත. එය කා බී විනෝද වීමට සුදුසු දිනයක් බව ඔවුන්ගේ පොදු මතය වනු ඇත. එහෙත් ඒ දිනය පිළිබඳ දුර්මත දාරීන් නොදත් විනෝදකාරී දිනයකට එහා ගිය සියලු මිනිස් ජීවිත වලට බලපානු ලබන මහත් සත්‍යයක් එහි ගැබ්ව පවතියි **(මතෙව් 1:21).**

සැබවින්ම නත්තලක් පිළිබඳ දේව වචනයේ කිසිදු ස්ථානයක හමු නොවනු අතර පොදු පිළිගැනීම වන දෙසැම්බර් 25 වෙනි දිනයද අනුමාන දිනයක්. එහෙත් තවත් සමහරු ඒ උපත අගෝස්තු මස සිදු වූවක් යැයි තර්ක කරති. දින වකවානු පිළිබඳ කුමන තර්ක මතදැරුවද වඩා වැදගත් වන්නේ ඒ ශ්‍රේෂ්ඨ උපතේ සැබෑ ජීව සාරය මිනිසා විසින් තමන් වෙත ලබාගෙන තිබේද යන්නයි. මෙම දිනයේදී මිනිසුන් මත්පැන් පානය කර අනිසි ලෙස හැසිර මහ මාවත් අයිනේ වැටී සිටිනු දැකීම සහ සූදූ පොළවල් පවත්වනු දැකීම සුලභ දසුනකි. මේ අතර නොයෙකුත් ආහාරපාන තෘෂ්ණා අධිකව අනුභව කරති. මිනිසා මෙවැනි ආහාර හරහාම මෙදින බොහෝ තෘෂ්ණාවලට වැටෙනු ලබති. ලොව මුල් යුවලද කෑමක් නිසාම තෘෂ්ණාවට වැටී පාපයක් කල බවද අප දනිමු. **(උත්පත්ති 3:6)** මේ දිනය කරණකොටගෙන එයම වන බව බොහෝ දෙනෙකුගේ ක්‍රියා මගින් පැහැදිලිව පෙනෙන්නට තිබේ. උන්වහන්සේගේ උපත පිළිබඳව කතා කිරීමේදී ඒ උපත පිළිබඳ පෙර විසූ අනාගතවාක්‍යන්ගේ මුවින් නොයෙක් වර කී සේක. **(මීකා 5:5), (යෙසායා 7:14)** මීට නිදසුනක් වේ.

එදා දෙවිදාණන්ගෙන් වෙන්ව ගිය මිනිසා සදාකාල විනාශයට යනවාට නොකැමතිව ඔවුහු යලි තමන් වහන්සේ තුළ ස්ථාපිත කිරීමේ මහා දිව්‍යමය සැලසුම වන්නේද තමන් වහන්සේගේ ඒකජාතක පුත්‍රයාව මේ ලෝකයට එවීමයි. **(ශු. යොහාන් 3:16, උත්පත්ති 3:15, රෝම 8:3).**

ඒ උපත එදා මෙදාතුර මිනිස් සන්තානයේ සිදුවූ ශ්‍රේෂ්ඨතම උපත හා සිදුවිය යුතුම වූ උපතකි. ඒ උපත නත්තලක් නමින් පෙර විසූ අනාගත වක්තෘවරුන්වත්, අලුත් ගිවිසුම තුළවත් කිසිදු ස්ථානයක සඳහන් නොවෙති. එහෙත් සඳහන්ව ඇත්තේ ශ්‍රේෂ්ඨ දරු උපතක් පිළිබඳ පමණි. උන්වහන්සේගේ ඒ උපතේ මහා හරය වනුයේ යක්ෂයාට හසුව තමාම වටිනා දිවිය අඳුරු කරගත් ඒ දිවිමගේ සමාප්තියයි. එසේ වී මුත් මිනිසා එහි වටිනාකම් තවමත් තේරුම් නොගෙන

සිටියි **(2 කොරින්ති 4:4).**

උන්වහන්සේගේ ඒ උපත පළමු කොට දන්වනු ලබන්නේ යටහත් පහත් මිනිසුන් වන එඬේරුන් වෙතටය. එම ස්වර්ගී ය දූතයන් ගෙනා ආරංචිය මුළු මිනිස් සංහතියටම සුභාරංචියක් වූයේ එතෙක් යක්ෂයාගේ වහල්භාවයේ සිටි මිනිස් සමාජයටම ඉන් ගැලවීමේ පණිවිඩය එහි අන්තර්ගතව තිබුණු නිසාය. **(ලූක් 2:10)** නමුත් එම සුභාරංචිය යුදෙව් නොවන්නන්ට සහ අන්‍යජාතීන් හටද සුභාරංචියක් විය. **(ලූක් 2:30-32)** තවද එදා උන්වහන්සේගේ උපතේදී තවත් විශේෂී දෙයක් සිදු විය. එනනම් ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීමයි. ඔවුහු උන්වහන්සේ වෙත පැමිණ නමස්කාර කර තමන් ගෙනා ත්‍යාග උන්වහන්සේට පිදුවෝය. **(ශු. මතෙව් 2:11)** ඔවුන් ගෙනා මේ තුන් ආකාර ද්‍රව්‍යයන් වන සුවඳලාටු, කට්ටකුමන්ජල් සහ රන් යන මේ තුනෙන්ම එතුමාණන්ගේ රාජකීයත්වය මරණය සහ පූජකත්වය තහවුරු විය. **(යෙසායා 60:6)** මෙම සුවිශේෂී දිනයේදී ලෝකයාට කිරීම සඳහා ඉතා විශේෂී දෙයක් ශේෂව ඇත. ඒ කුමක්ද?

එදා උන්වහන්සේගේ උපත ඇසූ ශාස්ත්‍රවන්තයින් කා බී ප්‍රීති වන පිණිස උත්සවයකට ආවා නොව එතුමාණන්ට තම හද පිරි නමස්කාරය පිදීම සඳහා පැමිණි ඔවුන් ප්‍රථම කොට කළේ උන්වහන්සේ සිටි ස්ථානය සොයමින් යුදෙව්වන්ට රජුව උපන් තැනන්වහන්සේ කොයිදැයි විමසීමයි **(මතෙව් 2:2, යෙරමියා 2:6)** බලන්න.

ඔවුන් දුරුකතර ගෙවාගෙන උන්වහන්සේව සොයාගෙන ආවාක් මෙන්ම මෙම දිනයේදී ඔබත් උන්වහන්සේව සෙවීමට සූදානම්ද? එසේ නම් ඒ උතුම් උපතේ වටිනා සාරය ඔබේ ජීවිතයට ගලා එනු ඇත. එය ඔබට අර්ථවත් නත්තලක් වනු නොඅනුමානයි.



මේ දිනය මුළු ලොවටම ඉතා විශේෂ වූ දිනයකි. ඒ මුළු මහත් ලෝකයාටම මෙනෙහි කිරීමෙන් යුතුව ක්‍රියා කිරීමට ඕනෑ කරන දිනයක් වන අතර එය ඉතා ගෞරවාන්විත දිනයකි. **(ලූක් 2:19-20)** උන්වහන්සේගේ මෑණියෝද එසේ ක්‍රියාකළේ මුළු මහත් මිනිස් ප්‍රජාවටම ආදර්ශයක් දෙමිනි. එදා එඬේරුන්ද තමන් ලද ප්‍රීතිදායක ආරංචිය සැබෑවක්ද යන්න දැනගැනීමට ඔවුහු ක්‍රියා කළහ. **(ලූක් 2:15-16)** අද මිනිසා තුළින් ගිලිහී ගොස් ඇති මෙම ක්‍රියාව අපට මෙම යටහත් පහත් එඬේරුන් සිහිකර දෙනු ලබයි. බොහෝ දෙනෙකු කුඩා බෝනික්කෙකු කුඩා ගවලෙනක් තුළ තබා ඊට වන්දනා කළද ඒ උපත සිදුවූයේ ලෝකයාගේ ගැළවීම උදෙසා බව කියන්න දන්නේද ස්වල්ප දෙනෙකු වන අතර බහුතරයක් දෙනෙක් එය හුදු චාරිත්‍රයක් ලෙස කරනු ලබති. ප්‍රේමණීය මිතුර මිතුරියනි, එදා උන්වහන්සේගේ

ඒ ශ්‍රේෂ්ඨ උපත ගවලෙනක සිදුවූයේ අහම්බෙන් නොව එය දේව සැලැස්මට අනුවමය. මන්දයත් එය ඉතා දිළිඳු සිටානයක් වන අතර වැඩි දෙනෙකුගේ අවධානයකට හසු නොවන ස්ථානයකි. එය ඕනෑම කෙනෙකුට, ඕනෑම මෙහොතක යන්නට එන්නට හැකිවීමම දුප්පත් පොහොසත් කොයි කාටවත් විවර වූ උන්වහන්සේගේ අතිමහත් ප්‍රේමය අපට පෙන්වයි. එය තරාතිරමකින් තොරවූ ප්‍රේමයයි. අප රටේ ප්‍රධාන පුරවැසියා වෙසෙන අරලිය ගහ මන්දිරයට හිතූ ලෙස යන්නට එන්නට කිසිවෙකුට බැරිය. එලෙසම අප ස්වාමීවූ රජිදානෝ එදා සුවිසල් මන්දිරයක උපන්නේ නම් නියත වශයෙන්ම දුප්පතුන්ට යෑමට නොහැකි වනු ඇත. එය තරාතිරමකින් තොරව ප්‍රේමයකැයි මා කීවේ එබැවිනි. නුමුත් එදා උන්වහන්සේගේ උපත එය අරඹයා දිළිඳු ගවහලේ උපන් නමුත් දැන් උන්වහන්සේ එදා ගවයන් කන ඔරුවක බාවා සිටි කුඩා බිළිඳු ළදරුවෙකු නොව විරාජමාන ලෙස මරණයෙන් උත්ථාන වූ රජ්පුරුවන්ය **(එළිදරව් 1:16).**

එහෙත් තවමත් මෙම දියුණු යුගයේද ලෝකයා කැමති උන්වහන්සේව බිළිඳෙකු ලෙස දැකීමටය. තවද ඒ දිනය ප්‍රීතිමත්දායක දිනයක් බව සැබෑය. එහෙත් මිනිසා විසින් වත්මන් ලෙස සමරන ආකාරයට කා බී මත් වී නොපනත්කම් කරමින් ලබන ප්‍රීතිය නොවේ. එය ආත්මික ප්‍රීතියකින් පිරී ඇත. **(යෙසායා 9:2)** නුමුත් ලෝකයා ඒ ආත්මික ප්‍රීතිය නිවැරදි ලෙස හඳුන්වා නොගැන්ම ඉතාමත් කණගාටුවකට හේතුවකි. යුග වෙනස් වී ඇති මුත් මිනිසා ඒ සම්බන්ධව වෙනස් වීමට සූදානම් නැත. මීට වසර 30කට පෙර බැලුවහොත් මිනිසා විසින් නත්තල් දින කොපමණ පසු කරනන්ට ඇත්ද? ඒ සැබවින්ම අර්ථාන්විතව නොවේ. එය මුළු වසරක් පුරාවට තම සිතෙහි ඒකරාශී වන ආශාවල් එළිදැක්වීමට කදිම දිනය ලෙසට මිස එය සම්බන්ධව අවබෝධාත්මකව සමරන අය ඇත්තේ ඉතා ස්වල්පයකි. සෑම වසරක් අවසානයේම මෙම දිනය මිනිසුන් ඉතා භක්ති ආදරයෙන් වැළඳ ගත්තද, එය පිළිබඳ අධ්‍යාත්මික සැලකිල්ලක් දක්වන බව පෙනෙන්නට නැත **(යෙසායා 42:20).**

සොයුර, සොයුරිය ලෝකයා බොහෝ මුදල් ගෙවා නිස්කාරනයේ ගෙවා දමන මෙම දිනයේදී මදක් සිතා බලන්න. එදා අප වෙනුවෙන්ම ගවයන් නිසා අපවිත්‍රවූ ගව මඩුවක මේ උපත ලද ශ්‍රේෂ්ඨ ගැළවුම්කරුවාණන් මේ ලබන්නාවූ නත්තල් දින ඔබේ පච්බර හදවත තුළ ඉපදුනේද කියා වැදගත් වන්නේද එයයි. එහෙයින් ලබන්නාවූ මෙම දෙසැම්බර් 25 වන දින වල්මත් නොවී එයට අර්ථාන්විතව මුහුණ දෙන්නට සිතට ගන්න. එවිට ඒ උපත සැබවින්ම ඔබට ත්‍යාගයක් වේවි. මම ඔබට මුලින් කීවා සේ ගෙවල් පමණක් නොව අපගේ ජීවිතයද එදාට අලුත් වීමට ඕනෑ කෙරේ.

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

# අලුත් අවුරුදු උදාවීමේ දේව මෙහෙය

## 2020 නව වසර දෙවියන්වහන්සේගේ පාද පාමුල සිට අරඹන්න

2019 දෙසැම්බර් 31 වන දින
රාත්‍රී 9.30 සිට නව වසර උදාව තෙක් පැවැත්වෙන
දේව මෙහෙයට ඔබත් අප හා එක්වන්න.

## නව වසරේදී ......

- ★ දිනපතා බයිබලය කියවීමට
- ★ දිනපතා යාච්ඤා කිරීමට
- ★ සෑම ඉරුදිනකම සභාවට පැමිණීමට
- ★ තම ආදායමෙන් දෙවියන්වහන්සේට කොටසක් වෙන් කිරීමට
- ★ එක් දිනයකදී එක් අයකුටවත් යේසුස්වහන්සේ ගැන සාක්ෂි දැරීමට

## 2020 නව වසරේ අපි අධිෂ්ඨානකර ගනිමු.

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com